**1990 සුවසැරිය පදනම - 2019**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

1990 සුවසැරිය පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd. ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම සහ 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26(ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2019 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණු මුළු පුනරාවර්තන වියදම රු.337,179,826 ක් වූ අතර එම වියදම ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී තිබුණු අරමුදල්වලින් වැයකර තිබුණි. එසේම 2019 වර්ෂය සඳහා රජය විසින් පදනමට ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනය 2021, 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් සියයට 25 ක් සියයට 50 ක් හා සියයට 75 ක් දක්වා අඩුකිරීමට 2019 අගෝස්තු 27 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර මූල්‍ය ප්‍රතිපාදන අඩුකිරීමෙන් පසුව පදනම පවත්වාගෙන යාම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවැනි යොජනාවක් 2021 ජනවාරි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම තත්ත්වය පදනමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සෘජුව බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වය වශයෙන් අදාළ සියළුම ලිපි ලේඛන හා හිමිකම් අදාළ අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කර ඇති බව, සම්පූර්ණ වියදම ප්‍රතිපූර්ණය කිරීමකින් කින් තොරව කාර්යක්ෂම මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා පිළිබඳව අවධාරණය කළ බව, එක් පැමිණීමකට ඩොලර් 2 බැගින් අය කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පැවතුන නමුත් ආණ්ඩු වෙනස්වීම් හා අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් එය ක්‍රියාත්මක නොවූ බව, 2021 වර්ෂයේදී පදනම නැවත වරක් නව අමාත්‍යාංශයක් යටතට පත් කෙරුණු බැවින් නව අමාත්‍යවරයා සමඟ මේ පිළිබඳව සාකච්ඡා කිරීමට සැලසුම් කර ඇති බව හා කොවිඩ් -19 අර්බුද සමයේදී සහ ඊට පෙර මහජනයාට ලබා දුන් සේවාව සැලකිල්ලට ගෙන අරමුදල් සපයා දෙන ලෙස ඉල්ලා සිටින බව. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ආයතනය බිඳවැටීමකින් තොරව පවත්වාගෙන යෑම සඳහා සුදුසු යාන්ත්‍රනයක් ස්ථාපිත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පදනම විසින් 2018 වර්ෂයේදී උණුසුම් කබා (Thermal Blanket) 627 ක් මිලදී ගැනීම සඳහා රු.4,583,511 කට සමාන එක්සත් ජනපද ඩොලර් 28,572 ක් අදාළ සැපයුම්කරු වෙත ගෙවා තිබුණු නමුත් කබා 225 ක් පමණක් සපයා තිබුණි. ඉතිරි කබා 402 ක වෙනුවෙන් ගෙවා තිබුණු රු.2,545,754 කට සමාන එක්සත් ජනපද ඩොලර් 18,319 ක් ආපසු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉන්දියානු සැපයුම්කරුගෙන් රු.2,545,754 ක් අයකර ගැනීමට කටයුතු කරමින් පැවති නමුත් 2020 මාර්තු මාසයේදී ඉන්දියාව තුළ කොවිඩ් -19 වසංගතය පැතිරීම හේතුවෙන් එම ක්‍රියාවලිය තාවකාලිකව නැවැත්වූ බව. | උණුසුම් කබා 402 ක ගෙන්වා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත හා 1465/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | යම් ගෙවීමක් රු.25,000 කට වැඩි වන අවස්ථාවලදී දෙන ලද ලදුපතක් වෙනුවෙන් රු.25 ක මුද්දර බදු අය කළ යුතු වුවද, පදනම විසින් පනත ප්‍රකාරව මුද්දර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වැටුප් ගෙවීමේදී වැටුපෙන් අයකළ යුතු රු.305,062 ක් වූ මුද්දර බදු පදනම විසින් වැයකර තිබුණි. | 2019 ජුනි මාසයේ සිට නියමිත පරිදි මුද්දර බදු අයකරන බව. | මුද්දර බදු පනතේ විධිවිධාන ප්‍රකාරව මුද්දර බදු අයකළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 507 හා 756 සහ 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2019 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා 2020 ජුනි 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගන්නා බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.392,433,414 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.209,501,025 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.182,932,389 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පදනමේ ඍජු වියදම් වැඩිවීම හා වෙනත් ක්‍රියාකාරකම්වලින් ලද ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. කෙසේ වුවද, පදනම ලාභ පාඩු අරමුණු කර නොගත් සංවිධානයක් වූ බැවින් පදනමේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා ඉන්දීය රජයෙන් ලබාදී තිබුණු ආධාර මුදල් උපයෝගී කර ගනිමින් මෙම ඌනතාවය පියවාගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වුවද, එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1,423 ක් වූයෙන් කාර්ය මණ්ඩල ඌනතාවය 569 ක් වූ අතර ඉන් 313 දෙනෙකු ගිලන් රථ රියදුරන් විය.<br>. | 2019 අගෝස්තු මාසයට පෙර බඳවා ගත් කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් වැටුප් නොමැතිකම හේතුවෙන් පදනමෙන් ඉවත්ව ගිය බව, වැටුප් වැඩි කිරීමෙන් පසුව බඳවා ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ අතර 2019 අගෝස්තු මාසයේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතව තිබුනද ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් එය කල් දැමූ බව, ඉන් පසුව 2019 නොවැම්බර් මාසයේදී නැවත දැනුම් දෙන තුරු බඳවා ගැනීම් නතර කරන මෙන් අමාත්‍යාංශය දැනුම් දුන් බව හා 2021 පෙබරවාරි මාසයේදී බඳවා ගැනීම් ආරම්භ කිරීමට අවසර ලැබුණු බැවින් රජයේ රෙගුලාසිවලට අනුකූලව බඳවා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමින් පවතින බව. | විධිමත් පරිදි අත්‍යාවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීමටත් අත්‍යාවශ්‍ය නොවන තනතුරු තිබේ නම් ඒවා යටපත් කර කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 2 (2) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී. 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, පදනම විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වර්ෂයකට අධික ප්‍රමාදයක් සහිතව 2021 මැයි 06 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2019 වර්ෂයේදී පදනම ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති බව, 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා නොදුන් බව හා ජාතික විගණන කාර්යාලය 2020 වර්ෂයේදී සම්බන්ධවීමෙන් පසු 2018 සහ 2019 මූල්‍ය ප්‍රකාශන සෘජුවම ඔවුන් වෙත ඉදිරිපත් කළ බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක PFD/RED/01/04/2014/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අදාළ පනතේ සඳහන් අරමුණු සක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 133 සහ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, ගණන්දීමේ නිලධාරී විසින් ස්වකීය රාජකාරි සහ වගකීම් ඉටු කිරීම සඳහා පදනම තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | පදනම සතු විගණන කණ්ඩායම විසින් පදනමේ මෙහෙයුම් හා එහි ක්‍රියාකාරිත්වයන් අඛණ්ඩව විගණනය කරන නමුත් ඔවුන්ගේ විෂයපථය තුළ මූල්‍ය විගණනය නොමැති බව, 2018 වර්ෂයේ ගෙවීම් වවුචර් ප්‍රතිපූර්ණය සඳහා අදාළ අමාත්‍යාංශය වෙත භාරදී ඇති බැවින් එම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය සිදුකර ඇති බව උපකල්පනය කළ බව හා 2021 වර්ෂයේදී සෘජුවම භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබෙන බැවින් නව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා බව. | අභ්‍යන්තර විගණන ඒකකයක් විධිමත් පරිදි ස්ථාපිත කළ යුතුය. |

## 4.4 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1), 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009 (1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, පදනම විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | 2019 වර්ෂයේදී සියලුම ගෙවීම් වවුචර් අදාළ අමාත්‍යාංශ වෙත භාරදී ඇති බව, අමාත්‍යාංශවල පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා පදනමේ නියෝජිතයා සහභාගීවූ බව හා 2020 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුව පත්කළ නමුත් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. |

## 4.5 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.5 මාර්ගෝපදේශය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය ලේඛනයෙහි පිටපතක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, පදනම විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟවන බව හා චක්‍රලේඛනයට අනුව ඉදිරියේදී විගණකාධිපතිවරයා වෙත වාර්ෂික අයවැය ලේඛනය ඉදිරිපත් කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.6 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “ 2030න්‍යාය පත්‍රය” පිළිබඳව පදනම විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්කයන් සඳහා වැඩ කරමින් හා සාක්ෂාත් කර ගනිමින් සිටින බව හා ඉදිරියේදී මෙම කරුණ පිළිබඳව අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අමාත්‍යාංශය මඟින් ලබා දෙන දර්ශක සමඟ වඩාත් සමපාත වීමට පියවර ගනු ලබන බව. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |